// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2074/33 - 2018 ජුනි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2 ඈ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

යෝජිත ඒකක 364 කින් යුත් මහල් නිවාස සංකීර්ණය (3 වන අදියර) - ගාලු පාර, රන්දොඹේ උතුර, බලපිටිය

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව කොළඹ 07, කිංසි පාර, අංක 100 දරන ලිපිනයේ අජිත් විජේසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජිත ඒකක 364 කින් යුත් මහල් නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය (3 වන අදියර) සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2018.06.08 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | - | නො : 500, ටී. බී. ජායා මාවත, කොළඹ 10 |
| 2. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - | 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 |
| 3. | මධ්‍යම පරිසර අධිකාරිය | - | නො : 104, පරිසර පියස, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |
| 4. | නාගරික සංවර්ධන අධිකාරිය | - | 6 හා 7 වන මහල, ''සෙත්සිරිපාය'' බත්තරමුල්ල |
| 5. | මාර්ග සංවර්ධන අධිකාරිය | - | ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |
| 6. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | ගාල්ල |
| 7. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | බලපිටිය |
| 8. | ප්‍රාදේශීය සභාව | - | බලපිටිය |
| 9. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | - | දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල |
| 10. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - | ප්‍රාදේශීය කාර්යාලය, අංක 274, පිල්ලගොඩ, උණවටුන, ගාල්ල |

1A - G 27801 — 27 (2018/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම යෝජිත මහල් නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2018.06.08 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
අධ්‍යක්ෂ ජනරාල්/වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය, 4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

දුරකථන අංක : 011-2449754, 011-2387922, 011-2449197
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623

06 - 755

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.